
# හිත හොඳ යාළුවෝ



තනුරි හංසනා බණ්ඩාර

# හිත හොඳ

# යාළුවෝ

තනුර් හංසනා බණ්ඩාර

I

# හිත හොඳ යාළුවෝ

## තනුරි හංසනා බණ්ඩාර

කතෘගේ වෙනත් පොත් -: අත්තම්මාගේ උපන් දිනය

පාසල -: මහාමායා බාලිකා විදුහල

පන්තිය -: 5 වසර E

කෘතිය පළ කරන දිනය -: - 2025/02/08

**ISBN -: IS37512**

# පිදුම

මාගේ අධ්‍යාපන කටයුතු වලදී මෙන්ම
විෂය බාහිර කටයුතු වලදීද මාගේ
ජිවිතයේ සියලුම අවස්ථා වලදීද
මාගේ ළඟින්ම

සෙවණැල්ලක් මෙන් හිඳ මාව
ආදරයෙන් රැක බලා ගන්නා මාගේ
ආදරණීය අප්පච්චීට ද

නිබදව මා ගැන සොයා බලන මාගේ
ආදරණීය ලොකු අම්මාට ද මෙම
පොත

## ආදරයෙන් පුදමි.!

## පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂුන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **“හෙරණගත්කරණී”** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රිය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.


එක කැලෑවක යාළුවෝ දෙන්නෙක් හිටියා. ඒ මුව පැටියෙක් හා මී පැටියෙකි. මේ දෙන්නා හරිම යාළුයි. මේ දෙන්නා කැවෙත් එකටමයි. සෙල්ලම් කළෙත් එකටමයි.




මෙයාලා හැමදාම කැලෑවේ ඈතට ගිහින් සෙල්ලම් කරන්න පුරුදු වෙලා හිටියා.

ඒ වෙලාවට මේ දෙන්නා කෑම සොයා ගෙන රස විඳලා බොහෝ වෙලා එකට ඉඳලා ගෙදර යනවා.

සමහර දවස් වලට මේ දෙන්නා සිංදු කියලා බට නලාව වාදනය කරලා බොහෝ වෙලා සතුටු වෙනවා.



ඉතින් දවසක් මී පැටියා සෙල්ලම් කරන්න ගිහින් ගොඩාක් වෙලා බලා ගෙන හිටියා. ඒත් මුව පැටියා ආවෙ නැහැ. බලා ගෙන ඉදලා බැරිම තැන මී පැටියා යාළුවා හොයා ගෙන කැලේ මැද්දට ගියා.



ඒ යන කොට මී පැටියට එයාගෙ යාළු මුව පැටියා කෙඳිරි ගාන සද්දෙ ඇහුණා. මී පැටියට තේරුනා යාළුවාට මොකක් හරි කරදරයන් සිදු වී ඇති බව.



මී පැටියා දැක්කා මුව පැටියා දඩයක්කාරයෙක් අටවපු උගුලකට අහුවෙලා ඉන්නවා. හොඳටම බය වුණ මී පැටියා මුව පැටියාගේ කකුලේ තදට හසුවි තිබුණ වැල් පොටවල් එයාගේ දත් වලින් හපන්න ගත්තා



මී පැටියා ඉතා ඉක්මනින් හැපුවත් එයාගෙ දත් ඉතා කුඩා නිසා මීපැටියාට බොහෝ වෙහෙසක් දැරීමට සිද්ද වුණා. අන්තිමේදි මුව පැටියාගේ උගුල කැපී මුව පැටියා එයින් නිදහස් වුණා.

මුව පැටියාට බොහෝ සතුටක් දැනුණා. තමන්ට උදවු කළ මී පැටියාවත් පිටේ තබා ගෙන මුව පැටියා ඉතා ඉක්මනින් එතනින් පිටත් වුණේ තමන්ට උගුල් අටවපු දඩයක්කරු පැමිණේද යන විපරමිනි.



යහළුවෙක් කරදරයක වැටුණාහම ලගින් සිටින උදව් කරන මෙවැනි මිතුරන් කල්‍යාණ මිතුරන්ය. අපිත් එලෙස කිරීමට සිතට ගත යුතුය.



නිමි



# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි  බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා  වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ  ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ  එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ  ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත්  සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන්  වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන්  ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දි තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්